සියලු ම හිමිකම් ඇවිරිණි]
(முழுப் பதிப்புரிமையுடையது)
All Rights Reserved]

27152

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 1996 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 1996 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 1996

උද්භිද විද්‍යාව I
தாவரவியல் I
Botany I

| 05 | |
|---|---|
| S | I |

පැය දෙකයි / இரண்டு மணி / *Two hours*

උත්තර පත්‍රයේ දක්වා ඇති ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
මෙම පත්‍රයේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීමට ඔබ වෑයම් කළ යුතු යි.

එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහක්** ඇති නමුදු නිවැරදි වන්නේ ඉන් **එකක්** පමණි. ප්‍රශ්නයට හොඳ ම පිළිතුර හැටියට ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය උත්තර පත්‍රයේ දක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න. වඩා පහසු ප්‍රශ්නවලට පළමුවෙන් පිළිතුරු දෙන්න. කිසියම් ප්‍රශ්නයක් අපහසු බව හැඟුණොත් එය මඟ හැර කාලය ඉතිරි වුවහොත් දෙවනු ව සලකා බැලීමට කල් තබන්න.

1. ප්‍රෝටීනවල මූල ද්‍රව්‍ය සංයුතිය හොඳින් ම පෙන්වන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරක ද?
(1) C, H, O (2) C, H, O, P (3) C, H, O, N, P (4) C, H, O, N, S (5) C, H, O, N, P, S

2. සංඝටකයක් ලෙස නයිට්‍රජන් අඩංගු **නොවන්නේ** පහත දක්වෙන සංයෝග අතරින් කවරක ද?
(1) RNA (2) රයිබෝස් (3) ATP (4) කයිටින් (5) ක්ලෝරොෆිල්

3. ශාකවල සුලබතම වන්නේ පහත සඳහන් සංයෝග අතරින් කවරක් ද?
(1) ක්ලෝරොෆිල් (2) කාබොහයිඩ්‍රේට (3) ප්‍රෝටීන (4) ලිපිඩ (5) න්‍යූක්ලෙයික් අම්ල

4. සුක්රෝස්වල සංයුතිය පෙන්වන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරක් ද?
(1) ග්ලූකෝස් - ග්ලූකෝස් (2) ග්ලූකෝස් - ෆ්‍රුක්ටෝස්
(3) ෆ්‍රුක්ටෝස් - ෆ්‍රුක්ටෝස් (4) ගැලැක්ටෝස් - ග්ලූකෝස්
(5) ගැලැක්ටෝස් - ගැලැක්ටෝස්

5. ප්‍රාග්න්‍යෂ්ටික සෛලවල දකිය නොහැකි වන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරක් ද?
(1) කාබොහයිඩ්‍රේට ආහාර සංචිත (2) රයිබොසෝම
(3) ප්‍රභාසංශ්ලේෂක වර්ණක (4) සෛල පටල (5) රික්තක

6. සාමාන්‍ය ආලෝක අන්වීක්ෂයක විශාලනය සීමා වන්නේ ආසන්න වශයෙන්
(1) X 1000 (2) X 5000 (3) X 40 (4) X 10 000 (5) X 100

7. පහත දක්වෙන ව්‍යුහ අතරින් කවරක පෙක්ටින් ප්‍රධාන සංඝටකයක් වේ ද?
(1) ප්‍රාථමික සෛල බිත්තිය (2) උච්චර්මය (3) මධ්‍ය සුස්තරය
(4) ද්විතීයික සෛල බිත්තිය (5) ප්ලාස්මබන්ධන

8. ඒකබීජපත්‍රික කඳන්වල හංගජාත කුහර සෑදෙන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරක් ජාරණය වීමෙන් ද?
(1) ප්‍රාක්ශෛලම (2) ප්‍රතිශෛලම (3) ප්ලෝයම
(4) මජ්ජාව (5) කලාපකොපුව

9. පහත දක්වෙන සෛල වර්ග අතරින් කවරක් වඩාත් ම ඝන සෛල බිත්ති දරයි ද?
(1) කැම්බියම (2) අන්තශ්චර්මය (3) ස්ථූලකෝණාස්තර
(4) දෘඪස්තර (5) අපිචර්මය

10. ජීවී සෛල තුළ සිදුවන පහත දක්වෙන ජෛවරසායනික පරිවර්තන අතරින් කවරක් ග්ලයිකොලිසිය නමින් හැඳින්වේ ද?
(1) ග්ලූකෝස් ⟶ එතනෝල් (2) ග්ලූකෝස් ⟶ පයිරුවික් අම්ලය
(3) ග්ලූකෝස් ⟶ $CO_2 + H_2O$ (4) ග්ලූකෝස් ⟶ ඇසිටල්ඩිහයිඩ්
(5) ග්ලූකෝස් ⟶ ලැක්ටික් අම්ලය

11. පහත දක්වෙන ප්‍රකාශ අතරින් කවරක් වැරදි වේ ද?
    (1) වෛරස සියල්ල අනිවාර්ය පරපෝෂිත වේ.
    (2) ආවෘතබීජක සියල්ල ස්වයංපෝෂී වේ.
    (3) බැක්ටීරියා සියල්ල විෂමපෝෂී නොවේ.
    (4) දිලීර සියල්ල විෂමපෝෂී වේ.
    (5) බැක්ටීරියා සියල්ල ප්‍රාග්න්‍යෂ්ටික වේ.

12. පහත දක්වෙන ශාක ගණ අතරින් කවරක් වල ප්‍රජනක සෛල ඇති කරයි ද?
    (1) *Chlamydomonas* (2) *Saccharomyces* (3) *Pseudomonas*
    (4) *Lyngbya* (5) *Hydrilla*

13. පහත දක්වෙන ප්‍රකාශ අතරින් කවරක් නිවැරදි ද?
    (1) ඇස්කබීජාණු බහිර්ජන්‍ය ලෙස බිහි වේ.
    (2) *Aspergillus* වල ජන්මාණු නිපදවයි
    (3) බැසිඩිබීජාණු ප්‍රරෝහණයෙන් ද්විකයික දිලීර ජාලය බිහි වේ.
    (4) *Phytophthora* වල ප්‍රජනක සෛල බිහි කරයි.
    (5) බැසිඩි බීජාණු බැසිඩියම තුළ ඇති වේ.

14. පහත දක්වෙන ශාක අතරින් කවරක පියවි ඇසට පෙනෙන නිදහස් ව ජීවත්වන ජන්මාණු ශාක නැත් ද?
    (1) *Marchantia* (2) *Pogonatum* (3) *Selaginella*
    (4) *Nephrolepis* (5) *Ulva / Cladophora*

15. වෛරස දිලීරවලින් වෙනස් වන්නේ ඒවා
    (1) ලිංගික ප්‍රජනනයක් නොපෙන්වන නිසා ය.
    (2) අනිවාර්ය පරපෝෂිතයින් නිසා ය.
    (3) පියවි ඇසට නොපෙනෙන නිසා ය.
    (4) ක්‍රියාකාරිත්වයට හානි නොවන සේ ස්ඵටිකරණය කළ හැකි නිසා ය.
    (5) ධාරක විශිෂ්ටත්වය පෙන්වන නිසා ය.

- 16 හා 17 ප්‍රශ්න පහත දක්වෙන ශාක (A - E) මත පදනම් වේ.
    A. *Cycas* B. *Selaginella* C. *Pogonatum* D. *Nephrolepis* E. *Thunbergia*

16. ඉහත සඳහන් ශාක අතරින් විෂමබීජාණුකතාව පෙන්වන්නේ
    (1) *B* පමණි. (2) *A* හා *B* පමණි. (3) *A*,*E* හා *C* පමණි.
    (4) *A*,*B* හා *E* පමණි. (5) *B* හා *E* පමණි.

17. ඉහත සඳහන් ශාක අතරින් විකසනය වන බීජාණු ශාකය ජන්මාණු ශාකය මත යැපෙන්නේ කවරක/කවර ඒවාහි ද?
    (1) *A* පමණි. (2) *A* හා *D* පමණි. (3) *A*,*C* හා *D* පමණි.
    (4) *A*,*B*,*C* හා *D* පමණි. (5) *A*,*B*,*C*,*D* හා *E* වල

18. *Pogonatum* ජන්මාණු ශාකය පිළිබඳ පහත සඳහන් ඒවා අතරින් කවරක් වැරදි වේ ද?
    (1) එහි සනාල පටක නැත.
    (2) එය ජීවන චක්‍රයේ ප්‍රමුඛ පරම්පරාව නොවේ.
    (3) එහි ජායාජන්මාණුධානි හා පුංජන්මාණුධානි වෙන් වෙන් ශාකවල බිහි වේ.
    (4) එහි මුල් නැත.
    (5) එහි පත්‍ර වැනි අවයව ඇත.

19. පහත සඳහන් ඒවා අතරින් කවරක් ස්වයංපෝෂියෙක් නොවේ ද?
    (1) *Ulva /Cladophora* (2) *Nitrosomonas* (3) *Pseudomonas*
    (4) *Nostoc* (5) *Loranthus*

20. පහත දක්වෙන සෛල වර්ග අතරින් කවරක් ශාක අපිචර්මයේ දකිය නොහැකි ද?
    (1) මූල කේශ (2) පාලක සෛල (3) බුබ්බුදකාර සෛල
    (4) ග්‍රන්ථිමය සෛල (5) උපල සෛල

● 21 හා 22 වැනි ප්‍රශ්න පහත දක්වෙන A හා B රූප සටහන් මත පදනම් වේ. මෙම රූප සටහන්වලින් පෙන්වන්නේ ශාක කොටස් දෙකක හරස්කඩවල පෙනෙන පරිදි සනාල පටකවල ස්වභාවයයි.




A B

21. පහත දක්වෙන විස්තර අතරින් කවරක් A රූප සටහනට ගැළපේ ද?
(1) බිහිකොන්, බහුකොන්, විවෘත සනාල කලාප
(2) ඇත්කොන්, බහුකොන්, විවෘත සනාල කලාප
(3) ඇත්කොන්, සයකොන්, නිමි සනාල කලාප
(4) බිහිකොන්, බහුකොන්, නිමි සනාල කලාප
(5) ඇත්කොන්, බහුකොන්, නිමි සනාල කලාප

22. B රූප සටහන පහත සඳහන් ඒවා අතරින් කවරක හරස්කඩ පෙන්වීම සඳහා සුදුසු වේ ද?
(1) *Zea mays* මුල (2) *Zea mays* කඳ (3) *Phaseolus* කඳ (4) *Phaseolus* මුල (5) *Oryza* කඳ

23. වැරදි ප්‍රකාශය තෝරන්න.
ලෙගියුමිනාසේ කුලයේ
(1) පුෂ්ප අධෝජායාංගී වේ. (2) පුෂ්පයේ මණි පත්‍ර පහකි.
(3) ඩිම්බකෝෂ ඒකකෝෂ්ඨී වේ. (4) පැලෙන ඵල ඇත. (5) පත්‍ර සරල ය.

24. *Anacardium occidentale* ශාකයේ කෑමට ගන්නා මාංසල කොටස එහි
(1) ඵලය වේ. (2) බීජය වේ. (3) පරිපුෂ්පය වේ. (4) පුෂ්ප වෘන්තය වේ. (5) බීජ කවචය වේ.

25. පහත දක්වෙන ශාක අතරින් කවරක භූගත තිරස් ව වැඩෙන කඳන් ඇත් ද?
(1) *Centella asiatica* (2) *Ipomoea batatas* (3) *Zingiber officinale*
(4) *Allium cepa* (5) *Colocasia esculenta*

26. පහත සඳහන් ලක්ෂණ අතරින් කවරක් සපුෂ්ප ශාකවලට පමණක් සීමා වේ ද?
(1) ජීවන චක්‍රයේ කලලයක් විකසනය වීම
(2) බීජ දැරීම
(3) ජීවන චක්‍රයේ ද්විත්ව සංසේචනයක් තිබීම
(4) විෂමරූපී පරම්පරා ප්‍රත්‍යාවර්තනයක් තිබීම
(5) හරිතලව තුළ ප්‍රභාසංශ්ලේෂක වර්ණක දැරීම

27. පහත සඳහන් ශාක අතරින් එකක් හැර අනිත් ඒවා එක ම කුලයකට අයත් ය. ඊට අයත් නොවන ශාකය කවරක් ද?
(1) *Borassus flabellifer* (2) *Nipa fruticans* (3) *Caryota urens*
(4) *Calamus rotang* (5) *Bambusa vulgaris*

28. පහත සඳහන් ශාක ලැයිස්තු අතරින් කවරක් ස්වභාවික ව එක ම ප්‍රජාවක වැඩෙන ශාක විශේෂ නොපෙන්වයි ද?
(1) *Ipomoea pescapre, Hydrophylax maritima, Spinifex littoreus, Cymbopogon nardus,*
(2) *Rhizophora mucronata, Bruguiera gymnorhiza, Sonneratia caseolaris, Ceriops tagal*
(3) *Drypetes sepiaria, Manilkara hexandra, Adina cordifolia, Vitex pinnata.*
(4) *Usnea barbata, Michelia nilagirica, Syzygium gardneri, Calophyllum walkeri*
(5) *Dipterocarpus zeylanicus, Mesua ferrea, Shorea stipularis, Dillenea retusa*

● ප්‍රශ්න 29 හා 30 පදනම් වී ඇත්තේ ජීව විද්‍යාවේ අභිවෘද්ධියට සේවය කළ පහත සඳහන් විද්‍යාඥයින් ගැන ය.
1. *Robert Hooke* (රොබට් හුක්) 2. *Melvin Calvin* (මෙල්වින් කැල්වින්)
3. *Hans Krebs* (හැන්ස් ක්‍රෙබ්ස්) 4. *Charles Darwin* (චාල්ස් ඩාවින්)
5. *Robert Koch* (රොබට් කොක්)

29. ප්‍රභාසංශ්ලේෂණයේ දී කාබන්වල මග සොයා ගැනීම පිළිබඳ ව ප්‍රසිද්ධියට පත් වූයේ මොවුන් අතුරින් කවරෙක් ද?

30. ස්වායු ශ්වසනයේ ජෛව රසායනික මග සොයා ගැනීම පිළිබඳ ව ප්‍රසිද්ධියට පත් වූයේ මොවුන් අතුරින් කවරෙක් ද?

[ අනෙක් පිට බලන්න.

27152

- 31 හා 32 ප්‍රශ්න පහත දක්වෙන ප්‍රස්තාර මත පදනම් වේ.




31. $CO_2$ සාන්ද්‍රණය හා ප්‍රභාසංශ්ලේෂණ ශීඝ්‍රතාව අතර සම්බන්ධතාව පෙන්වීමට වඩාත් උචිත වක්‍රය කුමක් ද?
(ප්‍රභාසංශ්ලේෂණ ශීඝ්‍රතාව Y අක්ෂයේ, $CO_2$ සාන්ද්‍රණය X අක්ෂයේ)

32. දෘශ්‍ය ආලෝකයේ තරංග ආයාමය හා ක්ලෝරොෆිල්වල ආලෝක අවශෝෂණය අතර සම්බන්ධතාව පෙන්වීමට වඩාත් ම උචිත වක්‍රය වන්නේ කුමක් ද?
(ආලෝක අවශෝෂණය Y අක්ෂයේ, තරංග ආයාමය X අක්ෂයේ)

- 33 සිට 35 ප්‍රශ්න ශ්‍රී ලංකාවේ දැකිය හැකි පහත දක්වෙන ශාක විශේෂ පහ මත පදනම් වේ.
(1) *Artocarpus nobilis* (2) *Diospyros ebenum* (3) *Arthrocnemum indicum* (4) *Camellia sinensis* (5) *Tectona grandis*

33. ඉහත දක්වෙන ශාක අතරින් කවරක් ස්වභාවික ව වියළි මිශ්‍ර සදාහරිත වනාන්තරවල දැකිය හැකි ද?

34. ඉහත දක්වෙන ඒවා අතුරින් කවරක් ශ්‍රී ලංකාවේ ඒකදේශික ශාකයක් වේ ද?

35. ඉහත දක්වෙන ශාක අතරින් කවරක් ශ්‍රී ලංකාවේ කරදිය-වගුරු බිම්වල දැකිය හැකි ද?

36. පහත දක්වෙන ඒවා අතරින් කවරක් ඉහළ වායුගෝලයේ ඕසෝන් ස්ථරයට බලපා ඇතැයි සැළකේ ද?
(1) කාබන්ඩයොක්සයිඩ් (2) මීතේන් (3) නයිට්‍රජන් ඔක්සයිඩ්
(4) ක්ලෝරෝෆ්ලෝරොකාබන් (5) ඔක්සිජන්

37. ශාකවල කාබොහයිඩ්‍රේට පරිවහනය කරන ප්‍රධාන ස්වරූපය වන්නේ
(1) සුක්රෝස් (2) ග්ලූකෝස් (3) රයිබෝස් (4) මෝල්ටෝස් (5) ගැලැක්ටෝස්

38. කාබන්, හයිඩ්‍රජන් හා ඔක්සිජන් හැරුණු විට ශාකවලට වැඩි වශයෙන් අවශ්‍ය වන මූල ද්‍රව්‍ය වනුයේ
(1) N, Ca, P, K, S, Mg (2) N, Ca, P, K, Cu, Mg (3) N, Ca, Zn, K, Cu, Mg
(4) N, Ca, P, K, S, Zn (5) N, B, K, P, S, Mn

39. පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක් වැරදි වේ ද?
(1) ***Rhizophora*** මූල් ප්‍රභාවර්ති චලන පෙන්වයි.
(2) ***Sesbania*** පත්‍ර නිද්‍රාසන්නමන චලන පෙන්වයි.
(3) ***Passiflora*** පතුරු ස්පර්ශසන්නමන චලන පෙන්වයි.
(4) ***Phaseolus*** බීජ පැළ ප්‍රභාවර්ති චලන පෙන්වයි.
(5) ***Cocos*** මූල් ගුරුත්වාවර්ති චලන පෙන්වයි.

40. පහත සඳහන් කවර මූලද්‍රව්‍ය - කාර්යය සම්බන්ධය වැරදි වේ ද?

| | මූලද්‍රව්‍ය | කාර්යය |
|---|---|---|
| (1) | නයිට්‍රජන් | ප්‍රෝටීන සංශ්ලේෂණය |
| (2) | අයන් | ක්ලෝරොෆිල් සෑදීම |
| (3) | පොස්පරස් | ප්‍රෝටීන සංශ්ලේෂණය |
| (4) | කැල්සියම් | සෛල බිත්ති සෑදීම |
| (5) | මැග්නීසියම් | ක්ලෝරොෆිල් සෑදීම |

- 41 සිට 42 ප්‍රශ්න පහත දක්වෙන විස්තරය මත පදනම් වේ.
පසේ ඇති අංශු ඒවායේ තරම අනුව කොටස් පහකට බෙදිය හැකි ය.
(1) බොරලු (2) රළු වැලි (3) සියුම් වැලි (4) රොන්මඩ (5) මැටි

41. පසේ අකාබනික පෝෂණ රඳවා ගැනීමට වැදගත් වන්නේ ඉහත සඳහන් කොටස් අතරින් කවරක් ද?

42. වැඩි වශයෙන් පවතින විට මුල්වල වර්ධනයට බාධා කරන්නේ ඉහත සඳහන් කොටස් අතරින් කවරක් ද?

43. වායුගෝලයේ ඇති ඔක්සිජන් ප්‍රමාණය සැලෙන මට්ටමකින් පවත්වා ගැනීමට උපකාරවන්නේ පහත දක්වෙන ක්‍රියාවලි අතරින් කවරක් ද?
(1) ප්‍රභාසංශ්ලේෂණය (2) ශ්වසනය (3) උත්ස්වේදනය
(4) දහනය (5) වියෝජනය

● 44 සහ 45 ප්‍රශ්න පහත සඳහන් දත්ත මත පදනම් වේ.

අනුකූල ව අභිජනනය කරන කොළ කරල් හා වටකුරු බීජ සහිත පී ශාක ප්‍රභේදයක් කහ කරල් හා හැකුළුණු බීජ සහිත තවත් ප්‍රභේදයක් සමග මුහුම් කළ විට $F_1$ ශාක සියල්ල ම කොළ කරල් හා වටකුරු බීජ සහිත විය. $F_1$ ශාක කහ කරල් හා හැකුළුණු බීජ සහිත ශාක සමග මුහුම් කළ විට පහත සඳහන් $F_2$ ප්‍රජනිතය ලැබිණ.

| | |
|---|---|
| කොළ කරල්, වටකුරු බීජ | 84 |
| කොළ කරල්, හැකුළුණු බීජ | 79 |
| කහ කරල්, වටකුරු බීජ | 83 |
| කහ කරල්, හැකුළුණු බීජ | 81 |

44. ඉහත සඳහන් මුහුම් පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතරින් කවරක් වැරදි වේ ද?
(1) ඉහත සඳහන් පළමුවන මුහුම ද්විඅංග දෙමුහුමකි.
(2) දෙවැනි මුහුම පිළි මුහුමකි.
(3) කොළ කරල් හා වටකුරු බීජ ප්‍රමුඛ ලක්ෂණ වේ.
(4) $F_1$ ශාක සියල්ල ද්විත්ව විෂමයුග්මයක වේ.
(5) $F_2$ ප්‍රජනිතයේ අනුකූල ව අභිජනනය කරන ශාක නැත.

45. $F_2$ ප්‍රජනිතයේ කොළ කරල් හා වටකුරු බීජ දරන ශාක ස්වපරාගණයට භාජනය කළ හොත් ඹිහිවන ප්‍රජනිතයේ රූපානුදර්ශ වර්ග කීයක් ඇති වේ ද?
(1) 16 (2) 9 (3) 4 (4) 2 (5) 1

● 46 - 48 ප්‍රශ්න පහත සඳහන් විස්තරය මත පදනම් වේ.

සුලබ ආහාර පරිරක්ෂණ ක්‍රම සමහරකට භාවිත වන මූලධර්ම හතරක් මෙහි දක්වේ.
A. අප්‍රතිකරණය
B. නිර්ජලීකරණය
C. ඉහළ උෂ්ණත්ව භාවිතය
D. ලුණු දැමීම

46. මාළු ටින් කිරීමේ දී භාවිත කරන්නේ
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) A හා C ය. (5) C හා D ය.

47. කිරිපිටි නිෂ්පාදනයේ දී භාවිත වන්නේ
(1) B හා C ය. (2) A හා B ය. (3) A, B හා C ය. (4) C පමණි. (5) B පමණි.

48. කරවල නිෂ්පාදනයේ දී භාවිත වන්නේ
(1) C හා D ය. (2) A හා B ය. (3) B හා D ය. (4) B හා C ය. (5) D පමණි.

49. පහත දක්වෙන ඒවා අතරින් කවරක් ජලය මගින් බෝ වන රෝගයක් වේ ද?
(1) උණසන්නිපාතය (2) පැපොල (3) සරම්ප (4) පිටගැස්ම (5) ක්ෂය රෝගය

50. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) උත්ස්වේදනය සිදුවන්නේ පූටිකාවලින් පමණි.
(2) නයිට්‍රජන් තිර කිරීම ප්‍රන්‍යෂ්ටික ජීවීන් තුළ මෙන් ම ප්‍රාග්න්‍යෂ්ටික ජීවීන් තුළ ද සිදු වේ.
(3) $CO_2$ මගින් කාබන් ලබා ගන්නා ජීවීන් පමණක් ස්වයංපෝෂීන් ලෙස හැඳින් වේ.
(4) පාංශු ද්‍රාවණයේ ඇති සෑම ඛනිජ මූලද්‍රව්‍යයක් ම මූල සෛලවලට නිෂ්ක්‍රිය ලෙස ඇතුළු වේ.
(5) කෘමිභක්ෂක ශාක විෂමපෝෂී වේ.

● 51 සිට 60 තෙක් ප්‍රශ්නවල දී ඒ යටතේ එන ප්‍රතිචාර අතුරින් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවැරදි ය. කවර ප්‍රතිචාරය/ප්‍රතිචාර නිවැරදි ද යන්න පළමුවෙන් ම විනිශ්චය කර ගන්න. ඉන් පසු තෝරන්න.

A, B, D යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ........................1
A, C, D යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ........................2
A, B යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ........................3
C, D යන ප්‍රතිචාර පමණක් නිවැරදි නම් ........................4
වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝගයක් හෝ නිවැරදි නම් ........................5

උපදෙස් සැකෙවින්

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| A, B,D නිවැරදි ය. | A,C,D නිවැරදි ය. | A,B නිවැරදි ය. | C,D නිවැරදි ය. | වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදි ය. |

51. පහත දක්වෙන රෝග අතරින් කවරක් දිලීර නිසා ඇති වන නමුත් බැක්ටීරියා හා වෛරස නිසා ඇති නො වෙයි ද?
A. එළවලුවල මෙලෙක් කුණුවීම
B. කෙසෙල් වද පීදීම
C. අර්තාපල් අංගමාරය
D. සුදු පිටිපුස්
E. පැපොල් විචිත්‍ර

52. ආහාර විෂ වීම් ඇතිවිය හැක්කේ පහත සඳහන් ඒවා අතරින් කවරක්/කවර ඒවා නිසා ද?
A. *Staphylococcus aureus*
B. *Clostridium botulinum*
C. *Salmonella typhi*
D. *Vibrio cholerae*
E. *Entamoeba histolytica*

53. පහත සඳහන් ඵල අතරින් කවරක / කවර ඒවාහි කෑමට ගන්නා කොටස ඵලාවරණයෙන් ඇති නොවේ ද?
A. දෙළුම් B. කෙසෙල් C. රඹුටන් D. කොස් E. පේර

54. *Cycas* බීජය පිළිබඳ ව පහත සඳහන් ඒවා අතරින් කවරක් / කවර ඒවා නිවැරදි ද?
A. භ්‍රෑණපෝෂය ඒකගුණක වේ.
B. පරම්පරා තුනක පටක අඩංගු ය.
C. බීජවෝලයක් ඇත.
D. ස්තර දෙකකින් යුක්ත බීජාවරණයක් ඇත.
E. සංචිත ආහාරය ප්‍රධාන වශයෙන් ලිපිඩ වේ.

55. ශාකවල දකිය හැකි පහත සඳහන් ලක්ෂණ අතරින් කවරක් / කවර ඒවා භෞමික පරිසරයට අනුවර්තනයක් ලෙස සැලකිය නොහැකි ද?
A. සන්ධාරක පටක තිබීම.
B. උච්චර්මයක් තිබීම.
C. හරිතලව තිබීම.
D. ස්වාධීන ජන්මාණුශාක හා බීජාණුශාක තිබීම.
E. සනාල පද්ධතියක් තිබීම.

56. සියලු ම බැක්ටීරියාවල දකිය නොහැක්කේ පහත සඳහන් ඒවා අතරින් කවරක් / කවර ඒවා ද?
A. කෝෂ්ඨය B. රයිබොසෝම C. කශිකා D. අන්තඃ බීජාණු E. සෛල පටල

57. ශාක කඳක හරස්කඩක් ඇනිලීන් සල්ෆේට්වලින් වර්ණගන්වා අන්වීක්ෂයෙන් බැලූවිට පහත දක්වෙන පටක අතරින් කවරක් / කවර ඒවා කහවර්ණ ගැන්වී පෙනේ ද?
A. ශෛලම පටකය.
B. දෘඪස්තර පටකය.
C. මෘදුස්තර පටකය.
D. ප්ලෝයම පටකය.
E. ස්ථූල කෝණස්තර පටකය.

58. ශාක සෛල බිත්තිවල දකිය හැකි පහත සඳහන් ද්‍රව්‍ය අතරින් කවරක් / කවර ඒවා ලිපිඩ වේ ද?
A. සුබෙරින් B. කියුටින් C. පෙක්ටින් D. ඉටි E. ලිග්නින්

59. පහත දක්වෙන ශාක චලන අතරින් කවරක් / කවර ඒවා වර්ධක චලන වේ ද?
A. ප්‍රභාවර්තනය.
B. ගුරුත්වාවර්තනය
C. නිද්‍රාසන්නමනය
D. පරිසර්පණය
E. කම්පාසන්නාමනය

60. පහත දක්වෙන ශාක අතරින් කවරක් / කවර ඒවා අපිභෞම ප්‍රරෝහණය පෙන්වයි ද?
A. *Ricinus communis*
B. *Phaseolus vulgaris*
C. *Oryza sativa*
D. *Zea mays*
E. *Cicer arietinum*